**ශීර්ෂය-283 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය

යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

----------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක 06 දරන මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එය දින 09 ක ප්‍රමාදයකින් පසු 2021 මාර්තු 09 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. තවද මූල්‍ය ප්‍රකාශන සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ඉදිරිපත් කළ යුතු වුවද 2021 මැයි මස 3 වන දින වන විටද දෙමළ භාෂාවෙන් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පසුගිය වර්ෂවලදී මූල්‍ය ප්‍රකාශන දෙමළ භාෂාවෙන් ඉදිරිපත් නොකල අතර, ඉදිරියේදී අවශ්‍යතාව පරිදි දෙමළ භාෂාවෙන් ද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) | මාර්ගෝපදේශ ප්‍රකාරව විෂය අංක 283011-283012 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2021 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එය දින 24 ක ප්‍රමාදයකින් පසුව 2021 මාර්තු 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අත්සන සඳහා 2021.05.25 දින පිටපත් 04න් යුතුව අමාත්‍යාංශය වෙත ගිණුම ඉදිරිපත් කල අතර, එම පිටපත් අත්සනින් පසු මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබුණේ මාර්තු මස 24 දින දීය. | -එම- |

## 1.6.2 හිඟ ආදායම්

දෙපාර්තමේන්තුවට අදාළ හිග ආදායම් වාර්තා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ ආදායම් ගිණුමට අනුව වර්ෂය අවසාන හිඟ ආදායම රු.983,982 ක් වුව ද, සමාලෝචිත වර්ෂයේ ආදායම් ගිණුමෙහි ආරම්භක හිඟ ආදායම ලෙස රු.1,216,082 ක් දක්වා තිබීම හේතුවෙන් රු.232,100 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මුළු ආදායම ගිණුම් ගත කිරීමේ දී එකතු කිරීමේ දෝෂයක් සිදුවී ඇති අතර මෙම වර්ෂයේ දී එම වරද නිවැරදි කිරීමට කටයුතු කරණු ලැබේ. | ගිණුම් කටයුතු නිවැරදිව සිදු කළ යුතු වීම. |
| (ආ) | වලස්මුල්ල අඩවි වන කාර්යාලය යටතේ පාලනය වන දැව ව්‍යාපාර ලියාපදිංචිය අළුත් නොකිරීම නිසා දෙපාර්තුමේන්තුවට ලැබිය යුතුව පැවති රු.134,052ක හිග ආදායම් ගිණුම් වලින් අත්හැරී තිබුණි. | හම්බන්තොට දිසා වන කාර්යාලය මගින් තොතුරු විමසා ඇති අතර තොරතුරු ලද වහාම මේ සඳහා පිළිතුරු ඉදිරිපත් කරණු ලබන බව කාරුණකව දන්වා සිටිමි. | ව්‍යාපාර ලියාපදිංචිය පිළිබඳව පසුවිපරම් කර හිඟ ආදායම් වාර්තා කිරීමට අදාළ නිලධාරීන් කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | තිස්සමහාරාම ගල් කොරියක් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු අවසර පත්‍ර ගාස්තුව රු.1,440,000ක් සහ ගල් කියුබ් 268.2ක් වෙනුවෙන් ලැබිය යුතු රු.201,150ක් හිඟ ආදායම් ලෙස ගණනය කර නොතිබුණි. | හම්බන්තොට දිසා වන කාර්යාලය මගින් තොරතුරු ලද වහාම පිළිතුරු ඉදිරිපත් කරණු ලැබේ. | ගල් කොරි පවත්වාගෙන යෑම පිළිබඳව පසුවිපරම් කර අදාල ආදායම් ගිණුම් සමඟ වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | හම්බන්තොට දිසා වන කාර්යාලයට අයත් ගල් කොරි 04ක, කැනිම් බලපත්‍ර මඟින් අනුමැතිය ලබා දි ඇති ගල් ප්‍රමාණය ඉක්මවා කැනිම් කිරිම හේතුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.34,916,952ක් හිඟ ආදායම් ගණනය කර නොතිබුණි. | හම්බන්තොට දිසා වන කාර්යාලය මගින් තොතුරු ලද වහාම පිළිතුරු ඉදිරිපත් කරණු ලැබේ. | බලපත්‍රයේ සඳහන් කැනීම් ගල් ප්‍රමාණය ඉක්මවා සිදු කරන ලද කැනීම්වලට අදාල ගාස්තු අයකළ යුතු අතර බලපත්‍ර සීමාව ඉක්මවා කැනීම් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | තිස්සමහාරාම සහ වලස්මුල්ල අඩවි වන කාර්යාල වලට අයත් රක්ෂිත කැළෑ වල පවත්වාගෙන යන සම්ප්‍රේක්ෂණ කුළුණු 02ක් වෙනුවෙන් අයවිය යුතු එකතුව රු.3,018,160ක් හිඟ ආදායම ලෙස ගණනය කර නොතිබුණි. | -එම- | ආදායම් නිවැරදිව හඳුනාගත යුතු වේ. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳව ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.<br>. | 2021 වර්ෂය සඳහා බැරකම් ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳව ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය. |

**1.6.4 විගණන සාක්ෂි නොවීම**

| නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස් කරන ලද රු.1,216,082ක හිඟ ආදායම් අයකිරීම් සනාථ කර ගැනිම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | හිඟ ආදායම් අයකිරිම සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු නොලබන අතර, දිසා වන කාර්යාලයල පවත්වා ගනු ලැබේ. ඉදිරියේ දී දිසා වන කාර්යාලවලින් එම වාර්තා ලබාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රධාන කාර්යාලය විසින් ප්‍රාදේශීය කාර්යාල කටයුතු නිරන්තරයෙන් අධික්ෂණයට ලක් කර අදාල වාර්තා නිවැරදිව පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු | පවත්නා ගැටලු මාණ්ඩලික නිලධාරි රැස්වීම් පවත්නා සාකච්ඡා කර සුදුසු පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බවත් ඉදිරියේදී මූල්‍ය පාලනය පිළිබඳ සමාලෝචනය සිදුකර වාර්තා කිරීමට කටයුතු කරන බව දන්වමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (අ) මුදල් රෙගුලාසි 104(1) , 104(3) | 2018 ජූලි 29 දින අනතුරට පත් වූ වාහනයක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවය හදුනාගෙන නොතිබු අතර අනතුර පිළිබඳව පූර්ණ වාර්තාවක් ද ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2020 මූල්‍ය ප්‍රකාශනයෙහි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයට එම තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | එම වාහන අනතුර සිදුවී ඇත්නම් ඒ පිළිබඳ දැනුම් දෙන ලෙස අදාල අංශ දැනුවත් කර ඇත | මු.රෙ. 104(3) ප්‍රකාරව අලාභහානිය සිදු වු දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ දින සිට මාස 6 ක් ඉක්මවා ඇති චෙක්පත් 157 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයේ අංක 7042475 බැංකු ගිණුමේ වසරකට වඩා පැරනි ඉදිරිපත් නොවූ චෙක්පත් 02ක් පමණක් ඇති අතර වටිනාකම රු.9,923.40කි. අනෙක් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ.396(ඇ) ප්‍රකාරව කටයුතු කර ඇත. අනෙක් බැංකු ගිණුම්වල චෙක්පත් සම්බන්ධයෙන් අදාල පරිදි කටයුතු කරන ලෙස දන්වා ඇත. | |
| (ඇ) මුදල් රෙගුලාසි 565(5) | පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කරනු ලබන මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතු වුවත් එම සාරාංශ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | පෙදු 71 ආකෘති පත්‍රය අප දෙපාර්තමේන්තුවෙහි භාවිතා කරනු නොලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2004 හා මුදල් රෙගුලාසි. 507 හා 756 | දෙසැම්බර් 15 ට දිනට පෙර සමීක්ෂණ මණ්ඩල පත්කර මු.රෙ. 128 යටතේ සඳහන් කාල රාමුව තුල භාණ්ඩ සමීක්ෂණයන් කල යුතු නමුත් දෙපාර්තමේන්තුව විසින් 2021 මැයි 05 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා කලාප කාර්යාල නිරීක්ෂණය සිදු කල යුතු බැවින් රටෙහි පවත්නා කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් එම කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති අතර,ඉදිරියේ දී එම කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2004 හා මු.රෙ. 128 යටතේ සඳහන් කාල රාමුව තුල භාණ්ඩ සමීක්ෂණයන් අනිවාර්යයෙන් කල යුතුය. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මාස 03 සිට වසර 05 ඉක්මවා ගොස් තිබුණු එකතුව රු.11,247,901 ක ණය ශේෂයක් පැවති අතර ඒවා අය කර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය අනුව කටයුතු කර නොතිබුණි. | ඒ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා කටයුතු කර ඇති අතර, එම තොරතුරු ලද වහාම පිළිතුරු ඉදිරිපත් කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය අනුව කටයුතු කළ යුතු වුවත් එම ණය මුදල් අයකර ගැනීම සඳහා කලමනාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට උත්සාහ දරා නොතිබුණි |

2.4 **තැන්පත් ශේෂයන්**

---------------------

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත සඳහන් පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 02 ක් ඉක්මවා තිබුණු එකතුව රු. 352,036,248 ක් වූ තැන්පතු මුදල් මු.රෙ.570(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරීමට කටයුතු කර නොතිබුණි. මෙය මුළු තැන්පත් මුදලින් සියයට 48.57ක් විය. | වසර දෙකකට වැඩි වුවද පුද්ගලික වන වගා කිරීමේ වැඩසටහන් යටතේ ගිවිසුම් ගතව තැන්පත් කර ඇති මුදල් එම ව්‍යාපෘති අවසන්වන තුරු තැන්පත් ගිණුමෙහි පවත්වාගෙන යා යුතුවේ. එම ව්‍යාපෘති සම්බන්ධයෙන් වරින් වර සිදු කරනු ලබන පාරිසරික ඇගයීම් කටයුතු හා හානිපූර්ණය සඳහා එම මුදල් වැය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි. | ඇතැම් තැන්පතු වසර 15 කටත් වැඩි කාලයක සිට කිසිදු වියදමක් නොකර පැවත එන බැවින් අදාළ ව්‍යාපෘති තව දුරටත් ක්‍රියාත්මක ද, නැතහොත් අවසන් වී තිබේ ද යන්න පසු විපරම් කර, මු.රෙ 571(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තිස්සමහරාම අඩවි වන කාර්යාලය යටතේ පාලනයවන වනාන්තර හෙක්ටයාර ප්‍රමාණය 9,781 ක් වුවද ඉන් රක්ෂිත වනාන්තර ලෙස ගැසට් කර ඇති ප්‍රමාණය හෙක්ටයාර 3,336 ක් වුයෙන් වනාන්තර 06 ක හෙක්ටයාර 6,445 ක භූමි ප්‍රමාණයක, එනම් මුලු වනාන්තර භූමි ප්‍රමාණයෙන් සියයට 65 ක් ගැසට් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | හම්බන්තොට දිසා වන කාර්යාලය මගින් තොරතුරු ලද වහාම පිළිතුරු ඉදිරිපත් කරණු ලැබේ. | දෙපාර්තමේන්තුවේ අරමුණු සහ ඉලක්ක ලගා කර ගැනීම සඳහා ඇස්තමේන්තු ගත කාර්යයන් කාර්යක්ෂමව ඉටු කළ යතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හම්බන්තොට දිසාවන කාර්යාලය යටතේ පාලනයවන හෙක්ටයාර 1,361.55 ක් වූ වනාන්තර 03 ක් මැනීම් කර තිබුන ද අවුරුදු 03 ක් ඉක්මවා ගිය ද ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | මැනීම් අවසන් කර ඇති වනාන්තර ගැසට් කිරීට කටයුතු කළ යුතුය. |
| (ඇ) | හම්බන්තොට දිසාවන කාර්යාලය යටතේ පාලනයවන හෙක්ටයාර 3,700.73 ක්වූ වනාන්තර 10 ක් රක්ෂිත වනාන්තර ලෙස නම් කිරීමට යෝජනා කර තිබුණ ද එම වනාන්තර මැන කඩිනමින් රක්ෂිතයන් බවට පත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් වනාන්තර අනවසර අල්ලාගැනීම, වනාන්තර එළිකොට හේන් වගාව කිරීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් දෙපාර්තමේන්තු නිර්දේශයකින් තොරව බලපත්‍ර නිකුත් කිරීම ආදී විවිධ ගැටලුවලට මුහුණපෑමට අඩවි වන කාර්යාලවලට සිදුව තිබුණි. | -එම- | රක්ෂිත වනාන්තර ලෙස නම් කිරීමට යෝජිත වනාන්තර සම්බන්ධව අදාල කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | කලාප කාර්යාල මඟින් තොරතුරු රැස් කර කාර්යසාධන වාර්තාව සකස් කිරීම සිදු කරමින් පවතින අතර, එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | නිලධාරීන් සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ නිල නිවාස 14 ක් ස්ථාපිත කර ඇතත් ඉන් නිල නිවාස 11ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව තිබුණි. තවද වලස්මුල්ල අඩවි වන කාර්යාලයට අයත් නිල නිවාස 03ක් හානියට පත්වී තිබුණි. මේ අනුව නිල නිවාසවල පරිපාලනය ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂනය විය. | පිළිතුරු ලබා දී නොමැත. | රාජ්‍ය සම්පත් වලින් උපරිම ප්‍රතිපල ලගාකර ගැනීම සඳහා කාර්යක්ෂමව භාවිතා කිරීමට සැලසුම් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | හම්බන්තොට දිසා වන කාර්යාලයට ලබාදී තිබුණු කැබ් රථ 2 ක් ගර්හිත තත්ත්වයේ තිබීම සහ පාපැදි 11 ක් භාවිතයෙන් තොරව දිරාපත්වෙමින් පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වත්කම් ප්‍රයෝජනයට ගත නොහැකි නම් සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පාඩුව රු. 25,000ට අඩු සිද්ධින් 19කට අදාලව රු.215,277ක් ද, පාඩුව රු.25,000ට වැඩි සිද්ධින් 59කට අදාලව රු.21,516,869 ක් ද, ගිණුම් ඉදිරිපත් කළ දින වනතුරුත් නිරවුල් කර නොතිබුණු අතර, ඉන් රු.6,144,377ක් වූ අලාභ වටිනාකමක් ඇති සිද්ධින් 28ක් අලාභ සිදු වි වර්ෂ 10කටත් වැඩි කාලයක් ගත වි තිබුණි.නමුත් මෙම පාඩු හා අත්හැරීම් නිරවුල් කිරිම සඳහා ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ සිට එක් එක් අංශවලින් වාර්තා කැදවීමෙන් නිරවුල් කිරීමට කටයුතු කරගෙන යන අතර සිද්ධීන් 15ක් පොතෙන් කපා හැරීමට කටයුතු කර ඇත. | මු.රෙ.104 ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මු.රෙ.109 ප්‍රකාරව පොතෙන් ඉවත් කිරිමට නිර්දේශ කර තිබුණු එකතුව රු.227,725ක අලාභ හානි සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | 53-9220, 120-4453, 26 ශ්‍රී 588 අංක දරන වාහන සම්බන්ධයෙන් ඉවත් කිරීමේ නියෝග ලැබී නොමැත. අදාල අංශවලින් වාර්තා කැඳවා ඇති අතර ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන් කර ගනිමි. | මු.රෙ. 109 ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2004 පෙබරවාරි 11 දින හානියට පත් වී තිබු අංක 53-5103 දරන කැබ් රථය සම්බන්ධයෙන් අදාළ පරික්ෂණ අවසන් කර වගකිවයුතු නිලධාරින්ගෙන් 2017 වසරේ දී මුදල් අයකර ගෙන ඇතත්, මු.රෙ 109 යටතේ පොතෙන් ඉවත් කිරිමට කටයුතු කර නොතිබුණු අතර, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන (i)හි ද එම ශේෂය දක්වා තිබුණි. | 53-5103 අංක දරන කැබ් රථය මුදල් අයකර ඇති බවට දෙපාර්තමේන්තුවට වාර්තාවී නොමැත. අදාල වාර්තාවේ සඳහන් පරිදි නඩු වාර්තාව ගෙන්වා ගෙන ඉදිරි කටයුතු කල යුතු බවට සඳහන් වන බැවින් එම වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. | -එම- |
| (ඈ) | වාහන අනතුරු 03කට අදාලව සිදුවී තිබුණු රු.40,600ක පාඩු ඊට වගකිවයුතු නිලධාරින්ගෙන් අයකළයුතු බැවින් මු.රෙ.104 යටතේ කටයුතු කළයුතු බව නිර්දේශ කර තිබුණ ද, එසේ කටයුතු කර නොතිබුණි. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ද ඒවා ඉදිරියට ගෙනවිත් තිබුණි. | කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නඩු වාර්තා කැඳවා ඇත. | මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කළ යුතුය . |
| (ඉ) | මුදල් රෙගුලාසි 109 යටතේ වන පාඩු හා අත්හැරීම් සම්බන්ධයෙන් පසුගිය වර්ෂවල සිදු වි අය කර ගැනිම් හා පොතෙන් කපා නොහල සියළුම අනතුරුවල පාඩුව ඇස්තමේන්තු කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ලබන සටහන් (i)හි ඇතුලත් කලයුතු වුව ද, සටහන (i)ට ඇතුලත් නොකළ හානි 04ක වටිනාකම රු.1,152,090ක් විය. | 2019 වර්ෂයේ සිට ඉදිරියට සිදුවූ අලාභ හානි පමණක් 2020 වර්ෂයේ ඇතුලත් කරන ලද අතර, මෙම වාහන 04, 2019 හෝ ඊට පසුව අලාභ හානිවලට ඇතුළත් නොවී තිබූ බැවින්, 2020 වර්ෂයේ දී ද ඇතුලත් වී නොමැත. නමුත්, 2021 වර්ෂය සඳහා ඒවා අලාභ හානි ලේඛනයේ ඇතුලත් කිරීමට සටහන් කර ගනිමි. | මූල්‍ය ප්‍රකාශන ආකෘතියට අනුව අදාල තොරතුරු නිවරැදිව ඉදිරිපත් කළ යුතුය. |

**3.5** **කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 වර්ෂයේදී හම්බන්තොට රන්මුදුවැව වනයේ පසට හා දේශගුණික සාධකවලට ඔරොත්තු නොදෙන පැළ සිටුවීම හේතුවෙන් පැළවලින් සියයට 50 ක් පමණ මියගොස් තිබූ අතර 2019 වර්ෂයේදී ද නැවත රු.540,408 ක් වැය කොට පැළ සිටුවා තිබුණි. වර්ෂ 03 ක් ගතවී තිබුණ ද පැළ සඳහා වතුර දැමීමේ ක්‍රමවේදයක් ස්තාපිත කර නොතිබුණි. මේ හේතුවෙන් නැවත සිටුවන ලද පැළ ද මැරීයාමේ අවධානමකට ලක්වී තිබුණි. | හම්බන්තොට දිසා වන කාර්යාලය මගින් තොතුරු ලද වහාම පිළිතුරු ඉදිරිපත් කරණු ලැබේ. | ප්‍රාදේශීයව පවතින දේශගුණික තත්ත්වය මත ප්‍රදේශයට සුදුසුවන පරිදි වන වගා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2017 හා 2018 වර්ෂ වලදී තාවකාලික ජංගම කඳවුරු පවත්වා ගැනීම සඳහා අයදුම්පත් 22 ක් ලැබී තිබුන ද, ඒ සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. තිස්සමහාරාම අඩවියට අයත් නිමලව රජයේ වනය තුළ කඳවුරු 20 ක් අනවසරයෙන් පවත්වාගෙන යන බව අනාවරණය කර ගෙන තිබුණ ද, ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ අධිකරණ ක්‍රියාමාර්ග ගෙන එම කඳවුරු ඉවත් කිරීමට හෝ නව බලපත්‍ර ලබාදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාමට අවසර දීමට හෝ යන දෙකින් වඩාත් සුදුසු ක්‍රියාමාර්ගය ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ අධිකරණ ක්‍රියාමාර්ග ගෙන එම කඳවුරු ඉවත් කිරීමට හෝ නව බලපත්‍ර ලබාදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාමට අවසර දීමට හෝ යන දෙකින් වඩාත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) හම්බන්තොට කොහොලංකල අවශේෂ වනයේ කැලිගම කෙමගම භූමියේ පවත්වාගෙන යන ගල් කොරියක් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ලබාදුන් කැණීම් බලපත්‍රය මත හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගාස්තු අය කර තිබූ බැවින් 2009 වර්ෂයේ සිට වාර්ෂිකව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට රු.36,000,000ක් බැගින් වූ ආදායමක් අහිමිවී තිබුණි. | හම්බන්තොට දිසා වන කාර්යාලය මගින් තොතුරු ලද වහාම පිළිතුරු ඉදිරිපත් කරණු ලැබේ. | ආදායම් රැස් කිරීමේ දී කළුගල් කැඩීම සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතු වීම හා නිවැරදි ගණනය යටතේ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ------------------------ | ----------------------------------- | ------------ |
| ජ්‍යෙෂ්ඨ මට්ටම, තෘතියික මට්ටම, ද්විතීක මට්ටම, හා සුළු සේවක වශයෙන් පිළිවෙලින් 36 ක, 18 ක, 323 ක හා 288 ක් වශයෙන් තනතුරු 665 ක පුරප්පාඩු වූ අතර ඒවා පිරවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඒ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා කටයුතු කර ඇති අතර, එම තොරතුරු ලද වහාම පිළිතුරු ඉදිරිපත් කරනු ලැබේ. | අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |